# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 55 — 1973 අප්‍රේල් 11 වැනි බදාදා — 1973.04.11

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# II වැනි කොටස—අධිකරණ

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)



| | පිට |
|---|---|
| පනත් ... | (අතිරේක) |
| ශ්‍රී ලංකා ඇපල් මහාධිකරණයේ දැන්වීම ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිස්ත්‍රික් උසාවිවල හා ඊට පහල උසාවිවල දැන්වීම ... | — |
| විස්තු භාගත්ව නඩු පිළිබඳ දැන්වීම ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම ... ... | — |
| පිස්කල් විකිණීම් පිළිබඳ දැන්වීම ... ... | 63 |
| බුදල් නඩු පිළිබඳ දැන්වීම ... ... ... | 64 |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තුව ... ... ... | — |
| විවිධ දැන්වීම ... ... ... ... | — |



## පිස්කල් විකිණීම් පිළිබඳ දැන්වීම්

### දකුණු පළාත

හම්බන්තොට පවත්වන තංගල්ල දිස්ත්‍රික් උසාවි නඩු ශාලාවේදීය

කොළඹ මහජන බැංකුව ........................ පැමිණිලිකාරයා.

එදිරිව

නොම්මරය: හ—ත. දි. උ—එම්/468 එදිරිව

(1) වීරකැටිය හන්දියකඩේ පදිංචි—ජයසිංහ මානච්චිගේ පියදාස, (3) වීරකැටිය, ප්‍රාථමික විද්‍යාලේ පදිංචි—අබේසිරි සමරනායක දොන් දියෝනිස් (4) වීරකැටිය, පාලත් කඩ පදිංචි—වගාච්චි කංකානම්ගේ දොන් ඩේවිඩ් ......... විත්තිකාරයෝ

මෙහි පහත සඳහන් දේපලවලින් ඉහත කී නඩුවේ 1, 3, 4, විත්තිකරුවන්ට තිබෙන අයිතිවාසිකම් සහ ප්‍රයෝජනයත් වර්ෂ 1972 ක් වූ මැයි මස 14 දින පෙ. ව. 10.00 ට එකී ඉඩමේ දී රු. 661.39 ක් සහ රු. 644 කට 6[illegible].13 දින සිට 70.10.15 දින දක්වා සියයට 11 බැගින් වාර්ෂික පොලියක්ද, ඉන් පසු මුළු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම වන තෙක් ඊට නීති පොලියද, අයකර ගැනීම සඳහා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්ට යෙදෙන බව මෙයින් දන්වනු ලැබේ.

උපලේඛනය

දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ උතුරු ගිරුවා පත්තුවේ මුල්ගිරිගල පිහිටි, උතුරට: මිරිස්කොරටුවද; නැගෙනහිරට: ලියන්ගහරුප්පද; දකුණට: සාමෙල්හෙකොරටුවද; බස්නාහිරට: පාළුවත්ත සහ තනිගෙදරද, යන මෙකී මායිම් තුළ අක්කරයක් පමණ විශාල "පින්වැවේගෙදර" නමැති ඉඩම. (4 වැනි විත්තිකාරයාට අයිති දේපලයි.)

යූ. ඒ. වීරසිංහ,
තංගල්ල අතිරේක නියෝජ්‍ය පිස්කල්.

වර්ෂ 1972 ක් වූ මාර්තු මස 22 වැනි දින,
තංගල්ල නියෝජ්‍ය පිස්කල් කන්තෝරුවේ දී ය.

4-332—73.04.11 දින අංක 55 දරණ ගැසට් පත්‍රය

### ඌව පළාත

බදුල්ල දිස්ත්‍රික් උසාවියේ දීය

පී. ඇස්. කන්දයියා, 5 වැනි කොටස, ස්ප්‍රින්වැලි වතුයාය, ස්ප්‍රින්වැලි. ........................................ පැමිණිලිකාරයා.

නොම්මරය: එම්ආර්/7656 එදිරිව

පරලෝසැපත් ඒල්. පකීර් සයිබු නොහොත් ඒ. ඒල්. පකීර් සයිබුගේ බූදලයේ පොල් මැකරු මොහොමඩ් හුසෙන් පකීර් සයිබු, අංක 17, වෝඩ් වීදිය, බදුල්ල......විත්තිකාරයා.

මෙහි පහත සඳහන් වෙන දේපලවලින් ඉහත කී නඩුවේ විත්තිපක්ෂයට තිබෙන අයිතිවාසිකම් සහ ප්‍රයෝජනයත් වර්ෂ 1973 ක්වූ මැයි මස 8 දින පෙරවරු 11 ට ඉඩම පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්ට යෙදෙන බව මෙයින් දන්වනු ලැබේ. එනම් රු. 3,000 ක් සහ ගාස්තුව රු. 31.50 ක් හා පවුන්ඩේජ් මුදලත් අයකර ගැනීම සඳහා.

ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයේ බදුල්ල කඩවත් සතර තුල බදුල්ල නගරයේ වෝඩ් වීදියේ පිහිටි වරිපනම් අංක 17 වශයෙන් පෙන්වා ඇති "බදුල්ල ග්‍රයින්ඩින් මිල්ස්" නමින් ඇඹරුම් මෝලක් පවත්වාගෙන යන, උතුරට: දේවාල වීදිය; නැගෙනහිරට: මෙම ඉඩමේම ඉතිරි කොටස; දකුණට: වෝඩ් වීදිය හා බටහිරට: මූකපිල්ලේ මහතාගේ ඉඩම වෙන් වන බැමි මෙන්ද මායිම්වූ පර්චස් 25 ක් ප්‍රමාණය ඇති පරණවලව්වේවත්ත නැමැති ඉඩමේ වෙන් කළ ඉඩම් කට්ටිය හා එහි තුල ඇති ඇඹරුම් මෝල තිබෙන ගොඩනැගිල්ල හා අනිකුත් දේවල්ද වේ. මෙය බදුල්ල ඉඩම් ලියාපදිංචි කරන කාර්යාලයේ අංක ඒ. 34/95 හා ඒ. 38/50 වශයෙන් ලියාපදිංචි කර ඇත.

රෝ. ජේ. ඔගස්ටින්,
ඌව පළාතේ පිස්කල් වෙනුවට.

1973 මාර්තු මස 29 දින,
බදුල්ලේ පිස්කල් කාර්යාලයේදීය.

4-379—73.04.11 දින අංක 55 දරණ ගැසට් පත්‍රය

---

සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ

### විශේෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කොළවලරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ. කුමන හේතුවක් නිසාවත් ප්‍රමාදවී ලැබෙන දැන්වීම් බාරගනු නොලැබේ.

1972 ජනවාරි මස 7 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.
කොළඹ,

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

# බූදල් නඩු පිළිබඳ දැන්වීම්

**මාතර දිස්ත්‍රික් උසාවියේ දිය**

**නයිසයි ආඥාවයි**

අන්තිම කැමති පත්‍රයක් නොයොදා රත්තෝ පදිංචිව සිටි නැසීගිය පල්ලියගුරුගේ පුණ්‍යදාසගේ බූදලය පිළිබඳ කාරණාව ගැනයි.

අකුරැස්සේ පදිංචි හේවා කටුවන්දේනියගේ ඥානවතී ........................................................................ පෙත්සම්කාරිය.

බූදල් නඩු අංකය: 5270. එදිරිව

1. පල්ලිය ගුරුගේ සූරියා ඥාන රංජනී පුණ්‍ය කුමාරි, 2. පල්ලිය ගුරුගේ සුසන්ත ප්‍රියදර්ශි, 3. පල්ලිය ගුරුගේ සපුමල් නිරූත්ත, 4. පල්ලිය ගුරුගේ යමුනා සර්වරේඛා, 5. පල්ලිය ගුරුගේ ඉසුරුමල්, 6. හේවාකටුවන්දෙනියගේ සිරිසේන සියල්ලෝම අකුරැස්සේ පදිංචිකරුවෝය......වගඋත්තරකරුවෝ.

පෙත්සම්කාරිය වෙනුවෙන් පෙනී සිටින නීතිඥ තිස්ස දිසානායක මහතා පෙනීසිටියදී 1972 ක්වූ සැප්තැම්බර් මස 8 වෙනි දින මාතර දිස්ත්‍රික් විනිශ්චයකාර තැන්පත් ජේ. එෆ්. ඒ. සෝසා මැතිතුමා ඉදිරිපිටදී මෙම කාරණය සුදුස්සක් කිරීමට ඉදිරිපත් කරන ලදුව පෙත්සම්කාරියගේ 1972 අගෝස්තු මස 4 දින දරණ දිවුරුම් ප්‍රකාශය කියැවීමෙන් පසු:

ඉහත නම් සඳහන් වගඋත්තරකරුවන් විසින් හෝ මෙම කාරණාව සම්බන්ධව උනන්දුවක් දක්වන වෙනත් අයෙක් ඇත්නම් ඒ අය විසින් හෝ 1972 දෙසැම්බර් මස 15 වෙනි දිනට පෙර මෙම අධිකරණය සෑහීමකට පත්වෙන අයුරු විරුද්ධවාදී කරුණු ඉදිරිපත් නොකොලොත් නැසීගිය තැනැත්තාගේ වැන්දඹු භාර්යාව වශයෙන් ඉහත නම් සඳහන් පෙත්සම් කාරියට එකී නැසීගිය තැනැත්තාගේ බූදලය පරිපාලනය කිරීමේ අයිතිය ඇති බවත්, ඒ අනුව ඇයට එම බූදලය පරිපාලනය කිරීම බූදල් පරිපාලන බලපත්‍ර නිකුත් කරන බවත්, මෙයින් නියෝග කර ප්‍රකාශකරනු ලැබේ.

තවද, ඉහත නම් සඳහන් වගඋත්තරකරුවන් විසින් හෝ මෙම කාරණාව සම්බන්ධව උනන්දුවක් දක්වන වෙනත් අයෙක් ඇත්නම් ඒ අය විසින් හෝ 1972, දෙසැම්බර් මස 15 වෙනි දිනට පෙර මෙම අධිකරණය සෑහීමකට පත්වන අයුරු විරුද්ධවාදී කරුණු ඉදිරිපත් නොකළහොතේ ඉහත නම් සඳහන් 1 සිට 5 දක්වා වන බාලවයස් කරුවන්ගේ නිත්‍යානුකූල භාරකරු වශයෙන් මෙම කාරනාව සම්බන්ධයෙන් ඉහතනම් සඳහන් 6 වෙනි වගඋත්තරකරු පත්කරන බව මෙයින් නියෝග කර ප්‍රකාශ කරනු ලැබේ. එම බාලවයස් කරුවන් 1972 දෙසැම්බර් 15 වෙනි දින මෙම උසාවියේදී මා ඉදිරි පිටට කැඳවිය යුතුබවද මෙයින් නියෝග කරමි.

ජේ. එෆ්. ඒ. සෝසා,
දිස්ත්‍රික් විනිස්චයකාරතැන.

1972 සැප්තැම්බර් මස 8 වෙනි දින.

1973 මාර්තු 2 වෙනි දිනට කල්තබන ලදී.
1973 ජූනි 8 වෙනි දිනට කල් තබන ලදී.

4–329—73.04.11 දින අංක 55 දරණ ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊලඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාක් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.

සෑ.යු.—මුදල් ගෙවා ගැසට් පතෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය

**1973**

| මාසය | පළකිරීමේ දිනය | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | |
|---|---|---|---|
| මාර්තු ... | 73.03.02 සිකුරාද ... | 73.02.23 සිකුරාද | දවල් 12.00 |
| | 73.03.09 සිකුරාද ... | 73.03.02 සිකුරාද | දවල් 12.00 |
| | 73.03.16 සිකුරාද ... | 73.03.09 සිකුරාද | දවල් 12.00 |
| | 73.03.23 සිකුරාද ... | 73.03.16 සිකුරාද | දවල් 12.00 |
| | 73.03.30 සිකුරාද ... | 73.03.23 සිකුරාද | දවල් 12.00 |
| අප්‍රේල් ... | 73.04.06 සිකුරාද ... | 73.03.30 සිකුරාද | දවල් 12.00 |
| | 73.04.11 බදාදා ... | 73.04.06 සිකුරාද | දවල් 12.00 |
| | 73.04.19 බ්‍රහස්පතින්දා ... | 73.04.11 බදාදා | දවල් 12.00 |
| | 73.04.27 සිකුරාද ... | 73.04.19 බ්‍රහස්පතින්දා | දවල් 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති

1972 ඔක්තෝබර් මස 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.